# කළගුණ දත් අලි පැංචා



කෙනොලි ලියන්සා රාජපක්ෂ

# කළගුණ දත් අලි පැංචා

කෙනොලි ලියන්සා රාජපක්ෂ

| | | |
|---|---|---|
| **ප්‍රථම මුද්‍රණය** | **:** | **2025** |
| **කර්තෘ** | **:** | **කෙනොලි ලිසන්සා රාජපක්ෂ** |
| **ලිපිනය** | **:** | **100/A අම්පිටිය පාර, මහනුවර.** |
| **ISBNඅංකය** | **:** | **978-624-208-219-6** |

# පිදුම

මගේ අම්මාටත්, තාත්තාටත්, අක්කාටත්,

පුංචි අම්මාටත් සහ බාප්පාටත්

මේ පොත

පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක ගමක හිටියා පුංචි

ළමයෙක් සහ බලු පැටියෙක්,


දවසක් ඒ දෙන්නා අඹ කඩන්න කැලේට

ගියා.




එතකොට තමා දැක්කේ අඹ ගහ හරිම

උසයි කියලා.



ඊට පස්සේ මේ දෙන්නා අඹ කඩාගන්න බැරුව දුකින් ඉන්නකොට ඈතින් විශාල ශබ්දයක් ඇහෙනවා.



මේ දෙන්නා ඒ ශබ්දයට බයවෙලා ගහ

පිටිපස්සේ හැංගිල බලාගෙන

ඉන්නකොට පුංචි අලි පැටියෙක් අඬ


අඬා මෙයාලා ළඟට ආවා.




ඊට පස්සේ ඒ ළමයා හැංගිලා හිටපු තැනින් එලියට ඇවිත් ඇහුවා මොකටද අලි පැටියෝ ඔයා අඬන්නේ කියලා.

ඊට පස්සේ අලි පැංචා කිව්වා මගේ අම්මව හොයාගන්න බැරුවයි මන් අඬන්නේ කියලා

මේ කතාව අහලා බලු පැටියට ගොඩක් දුක හිතුනා. එයා මෙයාට උදව් කරන්න ඉව කරගෙන ගිහින් අලි පැටියට අම්මව ඉන්න තැන හොයලා දුන්න.




අලි පැංචා ගොඩක් සතුටින් අම්මා ගාවට දුවගෙන ගිහින් ළමයගෙන් ඇහුවා ඔයාලා මේ කැලේ මොකද කරන්නේ කියලා.



ළමයා කිව්වා අපි අඹ කඩන්න ආවේ,

එත් අඹ ගහ හරිම උස නිසා අපිට අඹ

කඩාගන්න බැරි උනා කියලා.



එතකොට අලි අම්මා කිව්වා ඔයාලා මගේ පැටියව හොයල දුන්න නිසා ඒකට කළගුණ සැලකීමක් විදිහට ඔයාලට මං ඇති තරම් අඹ කඩලා දෙන්නම් කියලා.

අන්තිමට අඹත් කඩාගෙන යාලුවෝ දෙන්න සතුටින් ගෙදර ගියා.



නිමි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්